# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 3 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය (ඉවත් කිරීමේ ) පනත

---

[සහතිකය සටහන් කළේ **2005** පෙබරවාරි මස **10** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 පෙබරවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. **4.25** යි. **තැපැල් ගාස්තුව :** රු. **5.00** යි.

**2005 අංක 3 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය**
**(ඉවත් කිරීමේ) පනත**

[සහතික සටහන් කළේ 2005 පෙබරවාරි මස 10 වන දින]

එල්. ඩී.–ඕ. 25/2004.

**1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 3 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1993 අංක 60 දරන පනත ඉවත් කිරීම.

**3**. (1) 2 වන වගන්තිය මගින් 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත ඉවත් කිරීම නොතකා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී, 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා දුම්රිය අධිකාරියේ බැරව තිබූ සියලු මුදල්, එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

(2) (අ) ඉවත් කරන ලද පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය විසින් යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක පවරනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින්නා වූ ද සියලු නීති කෘත්‍යය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ නීති කෘත්‍යය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා දිගටම පවත්වාගෙන යා යුතු ය.

(ආ) ශ්‍රී ලංකා දුම්රිය අධිකාරියට පක්ෂව හෝ එයට එරෙහිව යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් විසින් ප්‍රකාශයට පත් කරන ලද සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපවත්වන පරිදි, දුම්රිය දෙපාර්තමේන්තුවට පක්ෂව හෝ එයට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

2-H 022934 -4,500 (2004/11)

1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සහ (200 වන අධිකාරය වූ) දුම්රිය ආඥා පනත ක්‍රියාත්මකව පවතින බවට සැලකිය යුතු බව.

**4**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ එදිනට පසුව, (200 වන අධිකාරය වූ) දුම්රිය ආඥාපනතේ සහ 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන, සියලු කාර්ය සඳහා 1993 අංක 60 දරන දුම්රිය අධිකාරිය පනත මගින් සංශෝධනය කරනු ලැබ නොමැති ලෙස පැවති ලෙසට ද පවතින ලෙසට ද සලකනු ලැබිය යුතු අතර, දුම්රිය විෂයය පාලනය කරනු ලබන නීතිය ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනතේ 1 වන වගන්තිය යටතේ වූ නියමය අවලංගු කිරීම.

**5**. 1993 අංක 60 දරන ශ්‍රී ලංකා දුම්රිය අධිකාරිය පනතේ 1 වන වගන්තිය යටතේ සාදන ලද (1) වන ඡේදය යටතේ වූ සහ 2003.07.23 දින අංක 1298/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මෙයින් අවලංගු කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.